Department of Education, Sabaragamuwa Province/ Weekly School Department of Education, Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති

පුරවැසි අධ්‍යාපනය පළමු වාර අවසාන ඇගයීම

1 වාරය සතිය 13

ශ්‍රේණිය :6

සකස් කිරීම _ මාවනැල්ල කලාපය

කාලය පැය 2

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමි වේ.**
- **1 - 5 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.**

01. පවුල හැරුණ විට සිසුන් යහපත් පුරවැසියන් කිරීමට උපකාරී වන ආයතනය වන්නේ ............................................ යි.
( පාසල/ අතිරේක පංතිය/ ක්‍රීඩා පිටිය/ ළමා සමාජය)

02. පාසලේ ප්‍රධාන පරිපාලන තනතුර වන්නේ .........................................................
(නියෝජ්‍ය විදුහල්පති / විදුහල්පති/ ජ්‍යෙෂ්ඨ අංශ ප්‍රධාන/ ප්‍රධාන ශිෂ්‍ය නායක)

03. පාසලේ සංවිධාන ව්‍යුහයට අයත් නොවන පිරිස වන්නේ ...................................................................... ය.
( ශිෂ්‍ය නායකයන් /ආදි සිසුන් / අනධ්‍යයන කාර්ය මණ්ඩලය / ගුරු මණ්ඩලය)

04. ඔබගේ ජීව දත්ත පත්‍රිකාවේ ඇතුළත් වන්නේ ............................................................ තොරතුරු යි.
(පියා පිළිබඳ / ඔබ පිළිබඳ / විදුහල්පති පිළිබඳ/ පංතිභාර ගුරුතුමිය පිළිබඳ)

05. ............................................................... පාසල් සිසුවකු වශයෙන් ඔබගේ වගකීම කි.
( පාසලේ සම්පත් ආරක්ෂා කිරීම / විනය නීති කඩකිරීම/ ගුරු ඇගයීම් කටයුතු / පෙළපොත් බෙදා දීම)

- **අංක 06 - 10 දක්වා ප්‍රශ්න වල ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද, ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.**

06. උප්පැන්න සහතිකයෙන් ඔබගේ නම නිවැරදි බව තහවුරු කරගත හැකි ය. ( )

07. C.W.W. කන්නන්ගර මැතිතුමා 1947 දී රාජ්‍ය මන්ත්‍රණ සභාවේ සභාපතීත්වය දැරී ය. ( )

08. පවුල තුළින් පුද්ගලයෙකුගේ හැකියා හා දක්ෂතා වර්ධනය කරගත හැකි ය. ( )

09. ඉවසීම නැතිකම සාර්ථක පුද්ගලයෙකුගේ චරිත ලක්ෂණයක් වේ. ( )

10. මිතුරන් සමඟ දැනුම හුවමාරු කර ගැනීම තම ඉලක්ක ජයගැනීම සඳහා යොදාගත හැකි ක්‍රමවේදයකි. ( )

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න වලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

11. ඔබේ දක්ෂතා වර්ධනය කර ගැනීම සඳහා කළ යුත්තේ මින් කුමක් ද?
1. අනුන් දෙස බලා සංසන්දනය කිරීම යි.
2. තම දක්ෂතා අවස්ථානුකූලව පෙන්වීම යි.
3. නිහඬව බලා සිටීම යි.
4. පුවත්පත් කියවීම යි.

12. දුර්වලතා අවම කර ගැනීම සඳහා පුද්ගලයෙකු කළ යුත්තේ මින් කුමක් ද?
1. තම දුර්වලතා හඳුනා ගැනීම යි.
2. විරුද්ධවාදීන් පරාජය කිරීම යි.
3. බොරුකීම යි.
4. තර්කානුකූලව කතා කිරීම යි.

13. ළමා මිතුරු පාසල් පරිසරයක දැකිය හැකි ලක්ෂණක් වන්නේ මින් කුමක් ද?
1. ප්‍රජාසහභාගීත්වය හිඟවීම.
2. ගුරු කේන්ද්‍රීය අධ්‍යාපනයක් පැවතීම.
3. ළමයින්ගේ මූලික හිමිකම් නොමැති වීම.
4. සුරක්ෂිත ඉගෙනුම් පරිසරයක් තිබීම.

14. අභියෝග ජය ගැනීම සඳහා වර්ධනය කරගත යුතු ගුණාංගය කි.
1. ආත්ම විශ්වාසය
2. ක්‍රීඩා කටයුතු වල යෙදීම.
3. ගුරුවරුන්ටකීකරු වීම.
4. යහළුවන් සමඟ කටයුතු කිරීම.

15. සැලසුම්කරණය හා සංවිධානය නිසා,
1. ගැටළුඋග්‍ර වෙයි.
2. කාලය නාස්ති වෙයි.
3. සිතේ පීඩාකාරී බව අඩුවෙයි.
4. සම්පත් අපතේ යයි.

- **16 සිට 20 දක්වා ප්‍රශ්නවලට පින්තූර ඇසුරින් පිළිතුරු සපයන්න.**




A

16. A පින්තූරයෙන් දැක්වෙන්නේ ........................................................ මැතිතුමාය.

17. එතුමා බාලාංශයේ සිට විශ්වවිද්‍යාලය දක්වා ...................................... ලබාදීමට කටයුතුකළේය.

18. ඔහු .........................................................................................යන විරුදාවලියෙන් හඳුන්වයි.



B

19. B පින්තූරයෙන් දැක්වෙන්නේ ......................................................... මැතිතුමාය.

20. ඔහු ........................................................................................ බිහි කිරීමට පුරෝගාමී විය.

(ල. 2 x 20 = 40 )


# II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නයට ලකුණු 16 ක් ද, අනෙකුත් ප්‍රශ්න සඳහා ලකුණු 11 බැගින් ද හිමිවේ.**

(01) ඉතිහාසය දැන ගැනීමට උපයෝගී වන සෑම දෙයක්ම මූලාශ්‍ර වේ.

i. ඔබේ පාසලේ ඉතිහාසය ඉගෙනීමට ඇති මූලාශ්‍ර 2 ක් ලියන්න.
ii. පාසලක අනන්‍යතාවය පිළිබිඹු කරන සංකේත 2 ක් ලියන්න.
iii. ඔබේ පාසල අයත් අධ්‍යාපන කොට්ඨාසය හා අධ්‍යාපන කලාපය පිළිවෙලින් ලියන්න.
iv. පාසල් සිසුවකු ලෙස ඔබගේ කාර්යභාරය ගැන කරුණු 2 ක් ලියන්න.
v. පාසලට නීති පද්ධතියක් අවශ්‍ය වීමට හේතු 2 ක් ලියන්න.
vi. පාසල් සංස්කෘතියට අයත් අංග 2 ක් ලියන්න.
vii. පාසල් කොඩිය භාවිතා කරන අවස්ථා 2 ක් ලියන්න.
viii. ඔබ තුළ පවතින දුර්වලතා 2 ක් ලියන්න. (ල. 2 x 8 = 16)

(02) " ශිෂ්‍යයා පාසලක සංවිධාන ව්‍යුහයේ ප්‍රධාන කොටස්කරුවෙකි."
පහත පාසල් සංවිධාන ව්‍යුහයේ ඇති අවස්ථා සම්පූර්ණ කරන්න.




ii. ඉහත B හි සිටින පුද්ගලයාගේ කාර්යයන් 4 ක් ලියන්න. (ල. 04)
iii. පාසල් සංවිධාන ව්‍යුහයේ ඇති වෙනත් කමිටු 4 ක් ලියන්න. (ල.04)

(03) I. පුද්ගලයෙකුට හැකියා හා දක්ෂතා වැඩිදියුණු කරගැනීම සඳහා යොදාගත හැකි ක්‍රමවේද 3 ක් ලියන්න. (ල. 03)
ii. පහත වගුව සම්පූර්ණකරන්න.

| සැලසුමකට වැඩ කිරීමෙන් ලැබෙන වාසි | සැලසුමකට වැඩ නොකිරීමෙන් ලැබෙන අවාසි |
|---|---|
| 1. ........................................ | 1. ........................................ |
| 2. ........................................ | 2. ........................................ |
| 3. ........................................ | 3. ........................................ |
| 4. ........................................ | 4. ........................................ |

(ල. 08)

(04) I. පාසල් සිසුවකු ලෙස ඔබට හිමිවන අයිතිවාසිකම් 4 ක් දක්වා ඒ හා බැඳුණු යුතුකම් ඉදිරියෙන් ලියන්න.

| ඔබ සතු අයිතිවාසිකම් | ඒ හා බැඳුණු යුතුකම් |
|---|---|
| 1. ........................................ | 1. ........................................ |
| 2. ........................................ | 2. ........................................ |
| 3. ........................................ | 3. ........................................ |
| 4. ........................................ | 4. ........................................ |

(ල. 04)

ii. පාසලෙන් ඔබට සපයා ඇති පහසුකම් 4 ක් ලියන්න. (ල. 04)

1. ..........................................................................................................................................

2. ..........................................................................................................................................

3. ..........................................................................................................................................

4. ..........................................................................................................................................


iii. ගුරුවරුන් වෙනුවෙන් ඔබෙන් ඉටුවිය යුතු යුතුකම් 3 ක් ලියන්න.

1. ..........................................................................................................................................

2. ..........................................................................................................................................


3. .......................................................................................................................................... (ල. 03)

(05) i. පහත දැක්වෙන රූපවල හිස්තැන් පුරවන්න.





(ල.03)

ii. පහත රූප සටහන් සම්පූර්ණ කරන්න.




(ල. 04)

iii.




(ල. 04)

06) පාසලක පවත්නා නීති රීති හා සම්ප්‍රදායන් හඳුනාගෙන නිවැරදිව යා කරන්න.

| |
|---|
| නීතිරීති |

| |
|---|
| සම්ප්‍රදායන් |

1. නිල ඇඳුම ප්‍රමිතියට සකස් කරගැනීම.
2. පාසලේ ආගමික වතාවත් නිවැරදිව ඉටුකිරීම.
3. දිනපතා පාසලට පැමිණීම.
4 නායකත්වයට අවනත වීම.
5. පාසල් කාලය තුළ පාසලේ රැඳී සිටීම.
6. කාල සටහනට අනුව වැඩ කිරීම.
7. පාසල ආරම්භ කිරීමට පෙර පාසලට පැමිණීම.
8. පාසල් ගීය ගායනා කරන විට නිවැරදි ඉරියව් ප්‍රකාශ කිරීම.
9. කාලයක් තුළ පැවත එන සිරිත් විරිත් අනුගමනය කිරීම.
10. ගුරුවරුන්ට ගරු කිරීම
11. සහෝදර සිසුන්ට උපකාර කිරීම.

(07) පහත දැක්වෙන උපකාරක පද ඇසුරින් ප්‍රහේළිකාව සම්පූර්ණ කරන්න.

<u>හරහට</u>

3 - රටක සිටින ජනතාව මේ නමින් හැඳින්වේ.

4 - සිසුන්ගේ සෞන්දර්යාත්මක හැකියා වර්ධනය කරන විෂයකි.

6 - විවිධ අංශ වලින් ඉගෙනුමෙහි නිරත වන දරුවන් පිළිබඳ සංවේදීව කටයුතු කරන අය වේ.

7 - ඔබ තුළ පවතින දුර්වල ගති ලක්ෂණයකි.

11 - පාසලේ සම්ප්‍රදායන් ආරක්ෂා කිරීමෙන් දරුවන් තුළ මෙම ලක්ෂණය ඇති වේ.

<u>පහළට</u>

1 - මෙවා රැකගැනීමේ වැදගත්කම කියාදීම පාසල මඟින් අවට ප්‍රජාවට ලබාදෙන පණිවිඩයකි.

2 - පාසලට මෙම පහසුකම රජයෙන් ලබා දේ.

5 - පාසල් කොඩිය එසවීමේ දී හා ගීතය ගායනා කරන විට මෙම ඉරියව්වෙන් සිටිය යුතුය.

8 - ඔබ තුළ පවතින යහපත් ලක්ෂණයකි.

9 - සැලසුම්කරණය හා සංවිධානය නිසා මෙය ඉතිරි වේ.

10-මෙවා කියවීමෙන් පුද්ගලයාගේ දැනුම හා හැකියා වැඩිදියුණු කරගත හැකිය.

